# ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශවල අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව සංකල්පයේ ව්‍යාප්තිය

**ඒ. එම්. එන්. ඩබ්. මෙන්ඩිස්**
**පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය**
***wasantha_mendis@yahoo.com***

ශ්‍රී ලංකාව, ථේරවාදි බෞද්ධ රටක් වූවත් මහායාන දහම හා ඒ හා සම්බන්ධ සංකල්පයන් ද ව්‍යාප්තවීමේ ප්‍රතිඵලයක් ලෙස අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව සංකල්පය ව්‍යාප්ත වී තිබේ. දැනට ලැබී ඇති ලිඛිත සාධක අනුව (තිරියාය සෙල්පිපිය) ක්‍රි.ව 7 වන සියවසේ දී පමණ මෙම වන්දනාව ව්‍යාප්ත වී ඇත.

ථේරවාදි බුදුදහම හඳුන්වාදීම හා මහායාන බුදු දහමේ බලපෑම සිදුවූයේ අනුරාධපුරය, පොළොන්නරුව ආදී රට අභ්‍යන්තරයේ ය. එහෙත් මෙම අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව රූප, මන්නාරම (මාන්තායි ප්‍රදේශය) මුලතිව් (ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශය) ගොඩවාය ආදී ප්‍රදේශවල බහුලව දැකිය හැක. Encyclopedia of Buddhism vol.1. හි වාර්තා කරන ආකාරයට නෞකා භංග, ගින්දර, මිනීමැරුම්, සොරසතුරු උපද්‍රව ආදියෙන් ජනයා ආරක්ෂා කිරීමේ හැකියාව අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයාට තිබේ. පාහියන්ගේ වාර්තා අනුව මිනිසුන්ගේ සෑම උපද්‍රවයකදීම ගැලවුම්කරුවකු ලෙස මොහු කටයුතු කරන බවයි.

මිනිසාගේ ලෞකික අපේක්ෂාවන් සාර්ථක කර ගැනීමේ අරමුණින් මෙම සංකල්පය වෙරළබඩ ප්‍රදේශවල ජනතාව අනුගමනය කළේ ද යන්න පිළිබඳවත් සිංහල මෙන්ම ද්‍රවිඩ ජනතාවත් පිළිගෙන ඇත්තේ ද යන්න පමණක් නොව අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන් ආරක්ෂක දෙවිකෙනෙකු ලෙස පිළිගෙන ඇති ආකාරයත් මෙහිදී අධ්‍යයනය කෙරේ. අවලෝකිතේශ්වර බෝධිසත්ත්ව සංකල්පයේ ප්‍රධාන මූලාශ්‍රය වන සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය සහ ක්ෂෙත්‍ර අධ්‍යයනය මගින් උපුටා ගන්නා සාධක ඇසුරින් මෙම පර්යේෂණය කෙරේ.

අවලෝකිතේශ්වර බෝධිසත්ත්වයන්, දෙවිකෙනෙකු ලෙස මංජුශ්‍රී මූලකල්පයෙහිද දැක්වේ. ශ්‍රී ලාංකිකයන් ඔහු දෙවි කෙනෙකු ලෙස සලකන්නට ඇති බවත් විදේශ වෙළඳම මෙන්ම ධීවර කටයුතුවලදි ආරක්ෂක දෙවිකෙනෙකු ලෙස සලකා පුද පූජා පවත්වන්නට ඇති බවත් නිගමනය කෙරේ.

***ප්‍රමුඛ පදඃ*** *අවලෝකිතේශ්වර, බෝධිසත්ත්ව, ථේරවාදය, මහායාන බුදු දහම*